

# ඩේවිඩ් කේ. බර්ලෝ සන්නිවේදන ආකෘතිය පිළිබඳ විග්‍රහයක්

ආචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ

කිසියම් විෂය ක්ෂේත්‍රයකදී ආකෘති (models) පදනම් කරගන්නේ එහි විද්‍යාත්මක පසුබිම හැදෑරීම පිණිසය. ආකෘතිවලින් ඒ ඒ විෂය ක්ෂේත්‍රයේ ක්‍රමානුකූල වර්ධනය ගැන අවබෝධයක් ලැබෙනු ඇත. විෂයක අන්තර්ගත ප්‍රධාන කරුණු සරල ආකාරයෙන් අවබෝධකර ගැනීම පිණිස ද ආකෘතියක් භාවිත කළ හැකිය.

කිසියම් සිද්ධාන්තයක් ගොඩ නගා ගැනීම සඳහා ද ආකෘතියක් මුල් කරගත හැකිවේ. මේ ආකාරයට සෑම විෂයක්ෂත්‍රයකම විවිධාර්ථ සඳහා ආකෘති භාවිත කළ හැකිය. සන්නිවේදන ආකෘති බිහිවීමේදී බලපෑ කරුණු අතර මූලිකව දක්නට ලැබෙන්නේ විවිධ විෂයයන් හි ප්‍රවීණත්වයක් ලද විද්වතුන් විවිධාකාර සන්නිවේදන ආකෘති ඉදිරිපත් කොට ඇති බවය. එබැවින් විවිධ විෂයයික පදනම සන්නිවේදන ආකෘති වල දක්නට ලැබේ. නිදසුනක් ලෙස හැරල්ඩ් ඩී. ලැස්වෙල් (Harold D. Lasswell) දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකි. ඔහු ඉදිරිපත් කරන ලද සන්නිවේදන ආකෘතිය දේශපාලන දෘෂ්ටිකෝණයෙන් සකස් වී තිබේ. ක්ලෝඩ් ෂැනොන් හා වොරන් වීවර් (Cloude Shannon & Warren Weaver) යන විද්‍යාඥයින් දෙදෙනා ගණිත ශාස්ත්‍රය පිළිබඳ ප්‍රවීණයන්ය. එම නිසා ඔවුන් ඉදිරිපත් කළ සන්නිවේදන ආකෘතිය ගණිතමය පදනමකින් යුක්තවේ. මහාචාර්ය ජෝර්ජ් ගර්බ්නර් (George Gerbner) මනෝ විද්‍යාව පිළිබඳ අවධානයක් තිබූ විද්වතෙකි. ඔහු ගේ සන්නිවේදන ආකෘතිය තුළ මනෝවිද්‍යාත්මක ලක්ෂණ දක්නට ලැබේ. මෙසේ විවිධ විෂයයන් ගේ පරිචයක් ලද විද්වතුන් ඔවුන්ගේ ශාස්ත්‍රීය ශික්ෂණය මත පිහිටා සන්නිවේදන ආකෘති ඉදිරිපත් කිරීමට උත්සාහ දරා තිබේ.

ඩේවිඩ් කෙනෙත් බර්ලෝ සන්නිවේදන විද්‍යාඥයාගේ සන්නිවේදන ආකෘතිය බොහෝ දෙනෙකුගේ අවධානයට ලක් වූවකි. අමරිකානු ජාතිකයකු වන ඩෙවිඩ් බර්ලෝ ඉලිනෝයි විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබ මිචිගන් සරසවියේ සන්නිවේදන අංශයේ දීර්ඝ කාලයක් සේවය කොට තිබේ. ඔහු විසින් 1960 දී පමණ ලියන ලද (The Process of Communication; An Introduction to theory and practices) නැමති ග්‍රන්ථයේදී මෙම සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කොට තිබේ. මෙහි මූලික ස්වරූපය දෙස බැලීමේදී සමාජ විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක ආකාරයකින් සන්නිවේදනය අවබෝධ කර ගැනීමට දැරූ උත්සාහයක් පෙනේ. එසේම සන්නිවේදනය යනු ක්‍රියාවලියක් බව ඔහුගේ ඉගැන්වීමයි.


ක්‍රියාවලියක් යනු එක්තැනක රැඳී පවතින්නක් නොවේ. එය නිරන්තරයෙන් ඒ මේ අත ගමන් කරන්නකි. එක් පුද්ගලයෙකුට එකම ස්වරූපයකින් මෙම ක්‍රියාවලියට සම්බන්ධ විය නොහැකිය. සන්නිවේදකයා යන පුද්ගලයා නිතරම සන්නිවේදකයකු ලෙස සිටින්නේ නැත. ඔහු ග්‍රාහකයා බවට ද අනිවාර්යයෙන් ම පත්වේ. ග්‍රාහකයාද පෙරලා සන්නිවේදකයෙකු වේ. මේ අදහස විල්බර්ශ්‍රාම් සිය සන්නිවේදන ආකෘතිය

තුළදී ප්‍රකාශ කොට තිබේ. එහෙත් බර්ලෝ විසින් ඉදිරිපත් කරන විග්‍රහය අනුව එය ග්‍රාම්ට වඩා වෙනස් ස්වරූපයක් ගනී. ඒ සඳහා පසුබිම් වන කරුණු ගණනාවක් ද සහිතව බර්ලෝ විසින් මේ වෙනස්කම පැහැදිලි කර දී තිබේ.

මහාචාර්ය බෙර්ලෝ ගේ සන්නිවේදන ආකෘතිය හඳුන්වන්නේ S - M - C - R ආකෘතිය යනුවෙනි.

1. S – Source - මූලාශ්‍රය (සන්නිවේදකයා)
2. M–Message- පණිවුඩය
3. C– Chanel - නාලිය
4. R– Receiver- ග්‍රාහකයා යනුවෙන් මෙය විවරණය වේ.

එය ආකෘතියක් ලෙස ඉදිරිපත් වී ඇත්තේ මෙසේය.




**1. මූලාශ්‍රය Source**

යම් සංදේශයක් සකස්කර ගැනීමේදී එයට පාදක කරගන්නේ කිසියම් තොරතුරු මූලාශ්‍රයකි. එම තොරතුරු මූලාශ්‍රය තෝරා ගැනීමේදී ඔහුගේ උත්තේජනය රුචි අරුචිකම් ආදි ලක්ෂණ බලපෑමට පුළුවන. මෙසේ විග්‍රහකරණ විට බර්ලෝ විසින් කරුණු පහක් දක්වා තිබේ. පළමුවැන්න සන්නිවේදන හැකියාවන්ය. (Communication Skills) සන්නිවේදකයෙකු ගේ හැකියාවන් විග්‍රහ කළ හැකිවන්නේ ඔහුගේ හෝ ඇයගේ ලිවීමේ, කථා කිරීමේ, කියවීමේ, සවන්දීමේ, සිතීමේ කුශලතාවන් පදනම් කරගෙනය. කෙබඳු සන්නිවේදකයකු වුවද තමන් සතු කුශලතාවන් ගැන අවබෝධයක් ලබා තිබීම වැදගත් වේ. නිදසුනක් ලෙස කිසියම් පුද්ගලයෙකු ට හොඳින් ලිවීමට හැකි අතර කථාකිරීමට එතරම් දක්ෂතාවක් නොමැත. තවත් කෙනෙකුට චිත්‍රණය සඳහා කුශලතාවක් ඇති අතර නර්තනය සඳහා දක්ෂතාවක් නොමැත. එබැවින් එම පුද්ගලයා සතු කුශලතාවන් විවිධ වේ. මෙය හඳුනා ගැනීමෙන් යම් කිසි පණිවුඩයක් මැනවින් ග්‍රාහකගත කිරීමට සන්නිවේදකයකුට ශක්තියක් ඇත. දෙවන ලක්ෂණය වන්නේ ආකල්පයි. (Attitudes) මෙයද කරුණු 3 ක් යටතේ විග්‍රහ කළ හැකිය.

1. තමා විසින් තමා කෙරෙහි දක්වනු ලබන ආකල්පය. යම්කිසි සිද්ධියක් පිළිබඳව අන්‍යයන්ට දැනුම්දීමේදී එය ඉදිරිපත් කිරීමට තරම් තමාට සුදුසුකමක් පවතින්නේ ද යන්න සළකා බැලිය යුතුය. එය නිසි පරිදි ඉදිරිපත් කිරීමට තරම් හැකියාවක් පවතින්නේද? එසේත් නැතිනම් එම කාරණය ඉදිරිපත් කිරීමෙන් ග්‍රාහකයා කෙබඳු විශ්වසනීයත්වයක් ගොඩ නගා ගන්නේද? යනාදිය සළකා බැලිය යුතුය.

2. වස්තු විෂය කෙරෙහි දක්වන ආකල්පය යම් සිද්ධියක් සන්නිවේදනයේදී මුල්කර ගන්නා අතර ඒ දෙස බලන්නේ කෙබඳු ආකාරයකින්ද? ගෞරවාන්විතව බලනවාද? උපහාසාත්මකව බලනවාද? නිෂේධනාත්මකව බලනවාද? මෙසේ වස්තු විෂය දෙස බලන දෘෂ්ටිය අනුව තෝරා ගැනීමටද පෙළඹේ.

3. සන්නිවේදකයා ග්‍රාහකයා කෙරෙහි දක්වනු ලබන ආකල්පය. තමාට ගෝචර වන ග්‍රාහක පිරිසෙහි ස්වරූපය අනුව සන්නිවේදකයා තම සංදේශය සකස්කර ගැනීමට වෙහෙසෙයි. උගත් සමවයස් - නූගත් - කණ්ඩායම් වලට යමක් ඉදිරිපත් කලයුතු වන්නේ ඒ කණ්ඩායම් වල ලක්ෂණ අනුවය.

තුන්වන ලක්ෂණය වන්නේ දැනුමයි. (Knowledge) සන්නිවේදකයෙක් සිය සන්නිවේදන කාර්යයේදී නිතරම උත්සාහ කරන්නේ සිය ග්‍රාහකයාට දැනුමක් ලබා දීමටයි. එසේ වුවත් මෙහිදී පැන නගින ගැටලු කිහිපයක් පවතී. තමා ප්‍රස්තුත කර ගන්නා විෂය ගැන සන්නිවේදකයාට දැනුමක් පවතීද? එසේ නොවුනහොත් අර්ථය නිසි පරිදි පෙල ගස්වා ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඔහුට නැත. අනෙක් අතට විෂය ගැන ගැඹුරු දැනුමක් ඇත්තෙකුටද අදාළ කණ්ඩායමට හෝ ජනමාධ්‍යයක් මගින් කරුණු ඉදිරිපත් කළ හැකිද? මෙහිදී ඔහු භාවිත කරන භාෂාව, ජනමාධ්‍ය, කාලය, ගැටලු උද්ගත කරයි. තමාට ලැබෙන කාලය තුළ දී ප්‍රස්තුත විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය ලබාදීමට අපොහොසත්ව වෙනත් අනවශ්‍ය කරුණු වලින් කාලය ඉඩකඩ අහුරා දමනු විය හැකිය.

තවත් අතකින් අලුත් විෂය දැනුමක් ඇත්තෙකුට එය වටහාගැනීමේ දුෂ්කරතාවක් උද්ගත විය හැකිය. ජනමාධ්‍යකරුවකුට මෙවැනි අවස්ථාවක විශාල කාර්යභාරයක් පැවරේ. තම මාධ්‍යගැනත් ග්‍රාහකයා හා විශේෂඥ පුද්ගලයා පිළිබඳවත් මනා අවබෝධයකින් ඔහුගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි පරිදි කරුණු උකහාගත යුතුය. සන්නිවේදන විද්‍යාඥයින් අතර මේ පිළිබඳව පවතින මත කිහිපයක් ඇත. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සමාන දැනුම් මට්ටමක් පැවතීම අවශ්‍ය බව එක් මතයකි. අනෙක් අදහස වන්නේ සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර දැනුම් පරතරයක් තිබීමද යෝග්‍ය බවයි. එසේ වූ විට ග්‍රාහකයා බැඳ තබා ගැනීමට හා විශ්වසනීයත්වයක් ගොඩනගා ගැනීමටද එය ඉවහල් වන බවය.

හතරවන ලක්ෂණය වන්නේ සමාජ පද්ධතිය (Social System) යන්නය. මානව සන්නිවේදන ක්‍රියාවලිය සෑම අවස්ථාවකදීම සිදුවන්නේ කිසියම් සමාජ පද්ධතියක් තුළය. එහිදී සන්නිවේදකයා තම සමාජ පසුබිම අනුව සංඥා සංකේත යනාදිය තෝරා ගනු ලැබේ. සමාජ සම්මුතීන්ට අනුව අර්ථය වටහා ගනු ඇත. සමාජ පසුබිම, සමාජ තත්ත්වය, සමාජ සම්බන්ධය, සියල්ල සන්නිවේදන කාර්ය හා සම්බන්ධවේ.

පස්වන ලක්ෂණය වන්නේ සංස්කෘතිය (Culture) යන්නය. මානවයා තමා බිහිවූ සමාජයට අනුගත වූ සංස්කෘතික සම්ප්‍රදායකට අයත්වේ. ගෝත්‍රික, ග්‍රාමීය, නාගරික යන කුමන සමාජ පරතරයකට අයත් වුවද ඔවුනට ආවේණික සංස්කෘක ලක්ෂණ පවතී. බර්ලෝ සිය සන්නිවේදන ආකෘතියෙන් දක්වන මෙම ලක්ෂණය සන්නිවේදක විද්‍යාඥයන් අද බහුලව අවධාරණය කරන්නකි. සන්නිවේදනය සංස්කෘතියෙන් හෝ සංස්කෘතිය සන්නිවේදනයෙන් හෝ වෙන්කළ නොහැකි බව ඒ අනුව ගොඩ නැගුණු මතයකි.

S - M - C - R යන ආකෘතියේ දෙවන කරුණ ලෙස දක්වන්නේ M- පණිවුඩය (Massage) යන්නයි. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සම්බන්ධතාව ගොඩ නැගෙන්නේ පණිවුඩය තුළිනි. පුද්ගලයන් දෙදෙනකු අතර සාරවත් සන්නිවේදනයක් ගොඩ නැගෙන්නේ පණිවුඩයේ අන්තර්ගත ලක්ෂණ අනුවයි. බර්ලෝ පණිවිඩය විග්‍රහ කිරීමේදී කරුණු 5ක් දක්වයි. එහි පළමුවැන්න මූලිකාංග (Elementry) යන්නය. පණිවුඩයක් ගොඩ නැගෙන්නේ එයට මුල් කරගන්නා යම් සිද්ධියක් අනුසාරයෙනි. එහි මූලික හරය කුමක්ද යන්න වටහාගත යුතුවේ. ග්‍රාහකයාට යම් බලපෑමක් ඇති කිරීම සන්නිවේදනයේ ලක්ෂණයක් වන බැවින් ඉදිරිපත් කරන කරුණුවල කොතරම් වැදගත් කමක් පවතීද යන්න සලකා බැලිය යුත්තකි. දෙවැන්න ව්‍යුහය (Structure) යන්නය. මෙයින් අදහස් කරන්නේ පණිවුඩයක් සකස්වීම, සංවිධානය කිරීම, ගොඩ නැගීම යන්නයි. පණිවිඩයක් ඉදිරිපත් කිරීමේදී එය අන්තර්ගතය මෙන්ම ඉදිරිපත් කරන ආකාරයද වැදගත්ය. විශේෂයෙන් සන්නිවේදන මාධ්‍යයන්ට වැදගත්වේ. ඒ ඒ මාධ්‍යය අනුව යොදා ගත හැකි ආකෘතිය කුමක්ද යන්න ජනමාධ්‍ය කරුවෙකු විසින්

තුන්වන ලක්ෂණය වන්නේ දැනුමයි. (Knowledge) සන්නිවේදකයෙක් සිය සන්නිවේදන කාර්යයේදී නිතරම උත්සාහ කරන්නේ සිය ග්‍රාහකයාට දැනුමක් ලබා දීමටයි. එසේ වුවත් මෙහිදී පැන නගින ගැටලු කිහිපයක් පවතී. තමා ප්‍රස්තුත කර ගන්නා විෂය ගැන සන්නිවේදකයාට දැනුමක් පවතීද? එසේ නොවුනහොත් අර්ථය නිසි පරිදි පෙල ගස්වා ඉදිරිපත් කිරීමේ හැකියාවක් ඔහුට නැත. අනෙක් අතට විෂය ගැන ගැඹුරු දැනුමක් ඇත්තෙකුටද අදාළ කණ්ඩායමට හෝ ජනමාධ්‍යයක් මගින් කරුණු ඉදිරිපත් කළ හැකිද? මෙහිදී ඔහු භාවිත කරන භාෂාව, ජනමාධ්‍ය, කාලය, ගැටලු උද්ගත කරයි. තමාට ලැබෙන කාලය තුළ දී ප්‍රස්තුත විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය ලබාදීමට අපොහොසත්ව වෙනත් අනවශ්‍ය කරුණු වලින් කාලය ඉඩකඩ අහුරා දමනු විය හැකිය.

තවත් අතකින් අලුත් විෂය දැනුමක් ඇත්තෙකුට එය වටහාගැනීමේ දුෂ්කරතාවක් උද්ගත විය හැකිය. ජනමාධ්‍යකරුවකුට මෙවැනි අවස්ථාවක විශාල කාර්යභාරයක් පැවරේ. තම මාධ්‍යගැනත් ග්‍රාහකයා හා විශේෂඥ පුද්ගලයා පිළිබඳවත් මනා අවබෝධයකින් ඔහුගෙන් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි පරිදි කරුණු උකහාගත යුතුය. සන්නිවේදන විද්‍යාඥයින් අතර මේ පිළිබඳව පවතින මත කිහිපයක් ඇත. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සමාන දැනුම් මට්ටමක් පැවතීම අවශ්‍ය බව එක් මතයකි. අනෙක් අදහස වන්නේ සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර දැනුම් පරතරයක් තිබීමද යෝග්‍ය බවයි. එසේ වූ විට ග්‍රාහකයා බැඳ තබා ගැනීමට හා විශ්වසනීයත්වයක් ගොඩනගා ගැනීමටද එය ඉවහල් වන බවය.

හතරවන ලක්ෂණය වන්නේ සමාජ පද්ධතිය (Social System) යන්නය. මානව සන්නිවේදන ක්‍රියාවලිය සෑම අවස්ථාවකදීම සිදුවන්නේ කිසියම් සමාජ පද්ධතියක් තුළය. එහිදී සන්නිවේදකයා තම සමාජ පසුබිම අනුව සංඥා සංකේත යනාදිය තෝරා ගනු ලැබේ. සමාජ සම්මුතීන්ට අනුව අර්ථය වටහා ගනු ඇත. සමාජ පසුබිම, සමාජ තත්ත්වය, සමාජ සම්බන්ධය, සියල්ල සන්නිවේදන කාර්ය හා සම්බන්ධවේ.

පස්වන ලක්ෂණය වන්නේ සංස්කෘතිය (Culture) යන්නය. මානවයා තමා බිහිවූ සමාජයට අනුගත වූ සංස්කෘතික සම්ප්‍රදායකට අයත්වේ. ගෝත්‍රික, ග්‍රාමීය, නාගරික යන කුමන සමාජ පරතරයකට අයත් වුවද ඔවුනට ආවේණික සංස්කෘක ලක්ෂණ පවතී. බර්ලෝ සිය සන්නිවේදන ආකෘතියෙන් දක්වන මෙම ලක්ෂණය සන්නිවේදක විද්‍යාඥයන් අද බහුලව අවධාරණය කරන්නකි. සන්නිවේදනය සංස්කෘතියෙන් හෝ සංස්කෘතිය සන්නි-වේදනයෙන් හෝ වෙන්කළ නොහැකි බව ඒ අනුව ගොඩ නැගුණු මතයකි.

S - M - C - R යන ආකෘතියේ දෙවන කරුණ ලෙස දක්වන්නේ M- පණිවුඩය (Massage) යන්නයි. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සම්බන්ධතාව ගොඩ නැගෙන්නේ පණිවුඩය තුළිනි. පුද්ගලයන් දෙදෙනකු අතර සාරවත් සන්නිවේදනයක් ගොඩ නැගෙන්නේ පණිවුඩයේ අන්තර්ගත ලක්ෂණ අනුවයි. බර්ලෝ පණිවිඩය විග්‍රහ කිරීමේදී කරුණු 5ක් දක්වයි. එහි පළමුවැන්න මූලිකාංග (Elementry) යන්නය. පණිවුඩයක් ගොඩ නැගෙන්නේ එයට මුල් කරගන්නා යම් සිද්ධියක් අනුසාරයෙනි. එහි මූලික හරය කුමක්ද යන්න වටහාගත යුතුවේ. ග්‍රාහකයාට යම් බලපෑමක් ඇති කිරීම සන්නිවේදනයේ ලක්ෂණයක් වන බැවින් ඉදිරිපත් කරන කරුණුවල කොතරම් වැදගත් කමක් පවතීද යන්න සලකා බැලිය යුත්තකි. දෙවැන්න ව්‍යුහය (Structure) යන්නය. මෙයින් අදහස් කරන්නේ පණිවුඩයක් සකස්වීම, සංවිධානය කිරිම, ගොඩ නැගීම යන්නයි. පණිවිඩයක් ඉදිරිපත් කිරීමේදී එය අන්තර්ගතය මෙන්ම ඉදිරිපත් කරන ආකාරයද වැදගත්ය. විශේෂයෙන් සන්නිවේදන මාධ්‍යයන්ට වැදගත්වේ. ඒ ඒ මාධ්‍යය අනුව යොදා ගත හැකි ආකෘතිය කුමක්ද යන්න ජනමාධ්‍ය කරුවෙකු විසින්

තීරණය කළ යුත්තකි. තුන්වැන්න අන්තර්ගතය (Content) යන්නයි. පණිවුඩයක් අර්ථවත් වන්නේ මෙහි අන්තර්ගත කරුණු අනුවය. අන්තර්ගතය දුර්වල වන්නේ නම් එය ග්‍රාහක අවධානයට ගනු නොවේ. අන්තර්ගත විෂය කරුණු පෝෂණය කර ගැනීමේ කාර්යභාරයට ජනමාධ්‍ය කරුවෙකුට පැවරෙන්නකි. සිව්වැන්නන කේතය (Code) යන්නයි. යමක් අප ප්‍රකාශ කරන්නේ සංකේත මුල්කර ගෙනය. චිත්‍ර-අකුරු-ඉරි-කැබලි- යනාදි විවිධ සංකේත පණිවිඩයක් සකස් කරන විට යොදා ගනී. එය නිර්මාණ ශිල්පියාගේ රුචිකත්වය අනුව ගොඩ නැගෙන්නෙකි. චිත්‍ර ශිල්පියා, සංගීත ශිල්පියා, ගණිතඥයා තම අදහස් ප්‍රකාශයේදී යොදා ගන්නා ක්‍රම වෙනස්ය. ඒවා වටහාගත හැකිවන්නේ අධ්‍යාපනික පසුබිම මතය. පස්වැන්න ඉදිරිපත් කිරීම (Treatment) යන්නයි. ඉහත සඳහන් කරන ලද කරුණු හතරෙහිම සම්බන්ධතාවක් මෙයට පවතී. පණිවිඩයක් ග්‍රාහකයාට යම් බලපෑමක් සඳහා ඉදිරිපත් කිරීමේදී ආකෘතිය, අන්තර්ගතය මෙන්ම මාධ්‍යයද වැදගත් වේ. යමක් ඉලක්ක කන්ඩායමකට කිව යුතු වන්නේ කෙසේද? එහිදී යොදා ගන්නා සන්නිවේදන විධික්‍රම කවරේද? වඩාත් විශ්වසනීයත්වයක් ඇති කරගත හැකි වන්නේ කෙසේද? යනාදි කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. කතා කරන භාෂාව විෂය කරුණු ඉලක්ක කණ්ඩායම් සඳහා කොතරම් ගැලපෙන්නේද? මේ සියල්ල පණිවිඩයක් ගොඩනගා ගැනීමේදී මෙන්ම ඉදිරිපත් කිරීමේදීත් සලකා බැලිය යුතු බව බර්ලෝ ගේ ආකෘතියෙන් පැහැදිලි වන්නකි.

S-M-C-R ආකෘතියේ 3 වන ලක්ෂණය වන්නේ නාලිය (Channel) යන්නයි. නාලිය යනු යම් පණිවිඩයක් සම්ප්‍රේෂණය කරන මාධ්‍යයි. තාක්ෂණික ක්‍රම භාවිත කොට අප යම් පණිවිඩයක් සම්ප්‍රේෂණය කළද මානවයා අවසානයේදී ග්‍රහණය කරගන්නේ තම පංචේන්ද්‍රියන් තුළිනි. පංචේන්ද්‍රයන් නාලිය ලෙස බර්ලෝ ආකෘතියේදී දක්වා තිබේ. දැකීම (Seeing) ඇසීම (Hearing) ස්පර්ශය (Touching) ආග්‍රහණය (Smelling) රසබැලීම (Tasting) යනුවෙනි. ඇස, කණ, නාසය, දිව, ශරීරය යන පස් ඉන්ද්‍රියන් ආශ්‍රිතව නාලිකා ගැන විග්‍රහ කරයි. මෙය වෙනත් සන්නිවේදන විද්‍යාඥයෙකු විසින් විග්‍රහ කළ ක්‍රමයට වඩා වෙනස් වූවකි. සන්නිවේදන විෂයේ පවතින ජීව විද්‍යාත්මක පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීමේදී මේ විවරණය වැදගත් වෙයි.

S-M-C-R ආකෘතියේ සිව්වැනි ලක්ෂණය වන්නේ ග්‍රාහකයා (Receiver) යන්නයි. ග්‍රාහකයා පිළිබඳ විග්‍රහ කිරීමේදී ද කරුණු පහක් යටතේ විවරණය කරයි. එහිදී සන්නිවේදන කුශලතා (Communication Skills) ආකල්ප (Attitudes) දැනුම (Acknowldge) සමාජ පද්ධතිය (Social System) සංස්කෘතිය (Culture) යන කරුණුය.

මෙයින් පැහැදිලිවන්නේ සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර වෙනසක් නොපවතින බවය. එක් වරක සන්නිවේදකයකු වන පුද්ගලයා තවත් වරෙක ග්‍රාහකයෙකු බවට පත්වේ. එම නිසා සන්නිවේදන ක්‍රියාවලියක් යනු සන්නිවේදන කේන්ද්‍රීය මෙන්ම ග්‍රාහක කේන්ද්‍රීයව ගොඩ නැගෙන්නකි. මහාචාර්ය විල්බර් ශ්‍රාම් (Wilbur Schramm) ඉදිරිපත් කළ ආකෘතියෙහිද මීට සමාන ආකාරයෙන් සන්නිවේදක ග්‍රාහක වෙනස්වන බව දක්වා ඇත. මුල් අවදියේදී සන්නිවේදකයා පමණක් ඉහළ තැනක සිටින බව පිළිගත් මතයට ප්‍රතිපක්ෂව බර්ලෝ, ශ්‍රාම් වැනි විද්වතුන් විසින් දක්වන ලද විග්‍රහයක් ලෙස මෙය හැඳින්විය හැකිය. බර්ලෝ තවදුරටත් විග්‍රහ කරන්නේ ග්‍රාහකයාගේ පවත්නා අධ්‍යාපන, සමාජ සම්බන්ධතා, සංස්කෘතික පසුබිම යනාදි කරුණු ද සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා උපකාරී වන බවය.

S-M-C-R ආකෘතියේ ප්‍රතිපෝෂණය ගැන බර්ලෝ අවධානය යොමුකර නැතත් ඔහුගේ විවරණයේදී සඳහන් කොට තිබේ. එමෙන්ම සන්නිවේදනය විග්‍රහ කිරීමේදී පරිපූර්ණ

ආකෘතියක් ලෙස මෙය සැලකිය නොහැකි බව බර්ලෝ සඳහන් කොට ඇත. එසේ වුවත් සන්නිවේදන ජාලයේ පවතින ගැඹුරු හා විශ්‍රැත බව වටහා ගැනීමට මේ ආකෘතිය පදනම් වී තිබේ. බර්ලෝගේ මෙම ආකෘතිය අංශ කීපයක් යටතේ විග්‍රහයට භාජනය කළ හැකිය. එනම් සමාජවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක, ජීවවිද්‍යාත්මක, දෘෂ්ටිකෝණ වලිනි. බර්ලෝ දක්වන පරිදි සන්නිවේදන ක්‍රියාවලිය හඳුන්වන්නේ සමාජ පද්ධතිය, සංස්කෘතිය, සමාජ සම්මුති ආදිය පදනම් කරගෙනය. එය සමාජවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් සන්නිවේදන ලක්ෂණ විග්‍රහ කිරීමකි. ආකල්ප, දැනුම, සංජානනය වැනි කරුණු ඔස්සේ සන්නිවේදනයේ පවතින මනෝවිද්‍යාත්මක පසුබිම මෙහි සාකච්ඡා කරයි. පණිවිඩයක් තෝරා ගැනීම, උත්තේජනය, පංචේන්ද්‍රියන්ගේ සම්බන්ධතාව යනාදියෙන් ජීව විද්‍යාත්මක ලක්ෂණ පැහැදිලිවේ. බර්ලෝ සිය සන්නිවේදන ආකෘතියෙන් සාකච්ඡා කරනු ලබන කරුණු පසු කාලයේදී බොහෝ සන්නිවේදන විද්වතුන්ගේ අවධානයට ලක්වී තිබේ.■

## ආශ්‍රිත ග්‍රන්ථ

1. Communication and Media Studies – James Watson and Anne Hill – Universal Book Stall, New Delhi – 1991

2. Communication Method for all Media – Hadley Read, University of Illinois press – 1975

3. Mass Communication – Principles and Practices – Mary B. Cassata and Molefi K. Asante, Macmillon Publication, U S A 1979